විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මාලිගාවත්ත ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2012 දිනය / திகதி / Date 2012-02-08

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/ 2012**

සියළුම දිසා ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**<u>පළාත් පාලන විශ්‍රාම වැටුප් මාසික ගෙවීම් ලේඛන පිළියෙල කිරීම සහ ලිපිගොනු භාරකාරත්වය ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත විමධ්‍යගත කිරීම</u>**

ම'විසින් නිකුත් කරන ලද 2010- 12- 13 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 12/ 2010 හා 2011- 07- 07 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 12/ 2010 (1) චක්‍රලේඛයන් අවලංගු කරමින් මෙම චක්‍රලේඛය නිකුත් කරමි.

## 1. පසුබිම

පළාත් පාලන විශ්‍රාම වැටුප් සහ පළාත් පාලන සේවා වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත සහ ඒ යටතේ පැනවූ අරමුදල් යටතේ ක්‍රියාත්මක විය. පළාත් සභා පිහිටුවීමෙන් අනතුරුව පළාත් රාජ්‍ය සේවය ස්ථාපිත වීමත් සමඟ පළාත් පාලන සේවකයන් පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහනය විය. 1993 අංක 17 දරන පළාත් සභා විශ්‍රාම වැටුප් පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක වීමට පෙර එනම් 1993- 09- 03 දිනට පෙර විශ්‍රාම ලැබූ පළාත් පාලන නිලධාරීන් වෙනුවෙන් පළාත් පාලන විශ්‍රාම වැටුප් ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක වේ. පළාත් පාලන අධ්‍යක්ෂවරයා යටතේ ක්‍රියාත්මක වූ පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රමය 1990- 01- 01 දින සිට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. ඉහත විශ්‍රාම වැටුප් ක්‍රමයේ වත්මන් බලධාරියා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වේ.

පළාත් පාලන විශ්‍රාම වැටුප් ලිපිගොනු මෙම දෙපාර්තමේන්තුවේ පළාත් පාලන විශ්‍රාම වැටුප් ඒකකය විසින් නඩත්තු කළ අතර විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 7/ 98 අනුව මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් කටයුතු 1999- 01- 01 දින සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත විමධ්‍යගත කළ අතර, ගෙවීම් කටයුතු සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන මෙම කාර්යාලය මඟින් ලබා දෙන ලදී.


| | Telephone | Fax | | Telephone | Fax | | Telephone |
|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | . | Payments | 2431612 |

E-mail: pensions@sltnet.lk
Web site: www.pensions.gov.lk

රජයේ විශ්‍රාම වැටුප් බැංකු පද්ධතිය හරහා ක්‍රියාත්මක කිරීම යටතේ 2006 මාර්තු සහ 2007 අප්‍රේල් (උතුර/ නැගෙනහිර) සිට ගෙවීම් ක්‍රියාවලිය තවදුරටත් විමධ්‍යගත කළ අතර, මාසික විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ලබා දුන් මුදල් ප්‍රතිපාදන ද නතර කොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ලබා දෙනු ලබන මුදල් ප්‍රතිපාදන උපයෝගි කොටගෙන ගෙවීම් කටයුතු සිදුකිරීමටත් එම වියදම් අදාළ වැය ශීර්ෂයට බැර කිරීමටත් උපදෙස් ලබා දී ඇත. ඒ යටතේ මාසික වෙනස්වීම් සහ ප්‍රාදේශීය ලේකම් විසින් වාර්තා කරනු ලබන මිය යාම් පදනම් කොටගෙන වැටුප් ලේඛන පිළියෙල කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කෙරුණි.

## 02. විමධ්‍යගත කිරීමේ ක්‍රියාවලිය

පළාත් රාජ්‍ය සේවය ස්ථාපිතවීමෙන් පසු විටින් විට පළාත් පාලන මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය විමධ්‍යගත කළ අතර මෙම කාර්යාලය විසින් සිදුකළ වැටුප් ලේඛන පිළියෙල කිරීම හා ලිපිගොනුවල භාරකාරත්වය ද 2011- 01- 01 දින සිට සම්පූර්ණයෙන් ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත විමධ්‍යගත කරන ලදී. ඒ අනුව 2011- 12- 31 දින සිට පළාත් පාලන විශ්‍රාම වැටුප් ඒකකය විසුරවා හැරීමට කටයුතු කරන ලද අතර දිස්ත්‍රික් ලේකම්වරු සහ ප්‍රාදේශීය ලේකම්වරු වෙත පහත උපදෙස් ලබා දෙමි.

(I) අදාළ මාසයේ පළාත් පාලන සේවා සිවිල් විශ්‍රාමිකයන්ගේ මිය යාම් වෙතොත් ඊළඟ මස 05 දිනට පෙර දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දීමට කටයුතු කළ යුතුය.

(II) දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් තම දිස්ත්‍රික්කය තුළ ඇති සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාල මාසික මිය යාම් පිළිබඳව වාර්තාවක් පිළියෙල කර ඊළඟ මාසයේ 25 දිනට ප්‍රථම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවීමට කටයුතු කළ යුතුය.

(III) පළාත් පාලන සේවා සිවිල් විශ්‍රාමිකයෙකු මිය ගිය විට ඔබ විසින් අදාළ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ලිපිගොනුව මෙම දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලුම් කළ යුතුය. (පළාත් පාලන විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය විමධ්‍යගත කිරීම යටතේ සිවිල් විශ්‍රාම වැටුප් ගොනු ඔබ වෙත එවා ඇති අතර යම් හෙයකින් සිවිල් විශ්‍රාම වැටුප් ගොනුව එවා නොමැත්තේ නම් එම විශ්‍රාම වැටුප් ලිපිගොනුවද වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ලිපිගොනුව සමඟ ඉල්ලුම් කිරීමට කටයුතු කළ යුතුය.) වැන්දඹු අනත්දරු අංකය ලබාදීම පහසු කිරීම සඳහා ඔබ භාරයේ ඇති සිවිල් ගොනුව අප වෙත එවීමට කටයුතු කළ යුතුය.

(IV) පළාත් පාලන විශ්‍රාම වැටුප් ලිපිගොනුව අවශ්‍ය අවස්ථාවලදී සිවිල්/ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ලිපි ගොනුවක් බවට පරිවර්තනය කොට මවිසින් ඔබ වෙත එවීමට ක්‍රියා කෙරේ. ඒ අනුව ඔබ විසින් අදාල ප්‍රදාන පත්‍රය නිකුත් කොට ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය.

(V) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදාන අංක නිකුත් කිරීමේ දී සිවිල් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදාන අංක නිකුත් කරන ක්‍රමයම අනුගමනය කළ යුතුය.

**උදාහරණ** - 1988- 03- 30 දින විශ්‍රාම ගන්නා ලද ඒ. කේ. සිරිසේන මයා 2010- 11- 11 දින මිය යන ලද අතර ඔහුගේ විශ්‍රාම වැටුප් අංකය 12100 වෙයි. ප්‍රදානය නිකුත් කරන්නේ බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යලයෙනි.

1988 වර්ෂයට අදාළ ලක්ෂ කාණ්ඩය 500000
1988 වර්ෂයට අදාළ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා 400000
බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අවසාන වරට නිකුත් කර ඇති භාරලක්ෂ කාණ්ඩයේ අංකය 410004 ය.

| දිස්ත්‍රික් අංකය | ප්‍රා.ලේ අංකය | සංකේත අංකය | ප්‍රදාන අංකය |
|---|---|---|---|
| 07 | 01 | 21 | 410005 |

(VI) සිවිල් විශ්‍රාම වැටුපකට අදාළව දස අවුරුදු සංශෝධනය සඳහා ඉල්ලුම් කළ විට ඔබ විසින් දස අවුරුදු සංශෝධනය කර ගෙවීමටත්, 1993- 09- 03 ට පෙර විශ්‍රාම ගිය පළාත් පාලන විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනයක් සඳහා ඉල්ලීමක් ලැබුණු විට එම ඉල්ලුම් පත්‍රය සහ විශ්‍රාම වැටුප් ලිපි ගොනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත් කටයුතු කළ යුතුය. සංශෝධිත විශ්‍රාම වැටුප් ගෙවීමේ දී පළාත් පාලන විශ්‍රාම වැටුප අහෝසි කොට සිවිල් විශ්‍රාම වැටුප් අංකය යටතේ ගෙවීම් කිරීමට ප්‍රාදේශීය ලේකම් වගබලා ගත යුතුය.

(VII) පළාත් පාලන සේවා සිවිල්/ වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාමිකයන්ගේ හැඳුනුම්පත් සකස් කිරීම ප්‍රාදේශීය ලේකම් විසින් සිදු කළ යුතුය.

පළාත් පාලන විශ්‍රාමිකයන්ගේ නව ප්‍රදානයන්, ප්‍රතිශෝධන ප්‍රදානයන් සිවිල් විශ්‍රාම වැටුප් අංක යටතේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අතර වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු සහ ආබාධිත ප්‍රදාන පත්‍ර නිකුත් කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදු කළ යුතුය.

කේ. ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් : 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
04. ගණකාධිපති.